## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2016

---

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

(i) 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ සංචාරක සංවර්ධන බදු මුදල ඉක්මවා, එම වර්ෂය වෙනුවෙන් ලද රු.28,123,058 ක සංචාරක සංවර්ධන බදු මුදල ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීමක් ලෙස හඳුනාගෙන වෙනස සිදු වූ කාලපරිච්ඡේදයේදී ගැලපීම සිදු කළ යුතු වුවද කාර්යාංශය විසින් එම සංචාරක සංවර්ධන බදු ඇස්තමේන්තුවෙහි සිදු වූ වෙනස අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශන වල ගලපා තිබුණි.

(ii) කාර්යාංශය විසින් පෙර වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම වෙනුවෙන් හර එකතුව රු.189,974,569 ක් හා බැර එකතුව රු.84,063,843 ක් සමාලෝචිත වර්ෂයේදී අදාළ ගිණුම්වල ගැලපීම් කර තිබුණද ප්‍රමිතිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

(i) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවර්ථන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක ඒ සඳහා ප්‍රතිපාදන කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්යාංශයට අවාසිදායක ලෙස ප්‍රකාශයට පත් කර තිබූ ඉන්දියානු චිත්‍රපට සම්මාන උළෙල වෙනුවෙන් වූ නඩු තීන්දු ප්‍රකාරව පසුගිය වර්ෂවලට අදාලව ගෙවියයුතු රු.30,570,497 ක් 2017 වර්ෂයේදී ගෙවා තිබූ නමුත් ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.588,197,382 ක මුදලක් අසම්භාව්‍ය බැරකම් වශයෙන් හෙළිදරව් කර තිබුණු අතර ඉන් 2014 වර්ෂයට අදාළ රු.310,762,704 ක වටිනාකමින් රු.206,353,290 ක් 2017 අගෝස්තු 21 දින පෞද්ගලික මාධ්‍ය ආයතනයකට ගෙවා තිබුණි. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවර්ථන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විටෙක එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත් උක්ත ගෙවා ඇති මුදල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේදී රු.3,304,920 ක් බොල් ණය හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කර තිබුණද ඒ පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිංගප්පූරු තානාපති කාර්යාලය විසින් එවන ලද ශේෂ සනාථ කිරීම්වලට අනුව කාර්යාංශයට ලැබිය යුතු රු.434,832 ක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී පවත්වන ලද ඉන්දියානු චිත්‍රපටි සම්මාන උලෙළ සඳහා දරන ලද වියදම් අය කර ගැනීම සඳහා බාහිර සැපයුම්කරුවන් සමඟ ඉකුත් වර්ෂවලදී ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.26,069,313 ක් ගෙවා තිබුණි. මෙම වියදම් මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පිරිවැය රු.7,400,000 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් රථ දෙකකට අදාළ ප්‍රත්‍යාගණන ගැලපීමේදී එම මෝටර් රථ දෙකකට අදාල සමුච්චිත ක්ෂය රු.7,400,000 ක් සමුච්චිත ක්ෂය ගිණුමෙන් ඉවත් නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.7,400,000 කින් අධි තක්සේරු වී ඇති අතර මෝටර් රථ ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම රු.5,300,000 ක් විය යුතු ප්‍රත්‍යාගණන අතිරික්තය රු.2,100,000 ක ප්‍රත්‍යාගණන අලාභයක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 2015 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද නැවත ප්‍රකාශිත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති සංඛ්‍යා සහ විගණනය විසින් එකී අයිතමයන්ට අදාළව ගණනය කරන ලද සංඛ්‍යා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| | ගිණුම | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව ශේෂය | ගණනය කිරීම අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i. | ලැබිය යුතු ගිණුම් | 876,256,774 | 864,656,912 | 11,599,862 |
| ii. | අත්තිකාරම් | 1,582,500 | 1,577,350 | 5,150 |
| iii. | දේපල පිරියත උපකරණ | 38,469,347 | 32,269,347 | 6,200,000 |
| iv. | කලින් ලද ආදායම් | 10,766,000 | 11,319,550 | (553,550) |
| v. | ගෙවිය යුතු තැන්පතු | 1,029,510 | 1,085,735 | (56,225) |
| vi. | උපචිත වියදම් සහ ණයහිමියෝ | 332,835,041 | 314,420,254 | 18,414,787 |

(ඉ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් එහෙත් භෞතික සත්‍යාපනය සඳහා විගණනයට ඉදිරිපත් නොකළ රු.3,193,011 ක් වටිනා විවිධ උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.239,475 ක් ක්ෂය කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.8,200,000 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් උපචිත වියදම් එම වටිනාකමින් වැඩියෙන් සහ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) පූර්ව වර්ෂ ගැලපීම්වලට අදාළව කළ නියැදි පරීක්ෂාවේදී 2014 වර්ෂයට අදාළ උපචිත වියදම් රු.13,994,803 ක් 2015 වර්ෂයේදී කපාහැර තිබූ අතර නැවතත් 2016 වර්ෂයේදී 2014 වර්ෂයට අදාළව රු.135,784,470 ක් උපචිත වියදම් වෙන්කර තිබූ අතර රු.2,171,110 ක් කපා හැර තිබුණි. මේ අනුව උපචිත වියදම් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය මෙන්ම මූල්‍ය තත්ත්වයද නිවැරදිව පිළිබිඹු නොවීමට ඇති ඉඩකඩ විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඌ) 2013 වර්ෂයේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම වෙනුවෙන් මිලට ගෙන තිබුණු රු.1,529,500 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඊට අදාල ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) තනාපති කාර්යාල වෙත ප්‍රේෂණය කළ මුදල් | 24,491,929 | ශේෂ සනාථ කිරීම |
| (ආ) ජාත්‍යන්තර ඉන්දියානු සිනමා උළෙලේ වියදම් | 276,000 | අදාළ නඩු තීන්දුවේ පිටපත |
| (ඇ) දේපල, පිරියත හා උපකරණ | 3,193,011 | භෞතිකව තහවුරු කිරීමට අදාළ වත්කම් |

**2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මතු දැක්වෙන ගිණුම් ශේෂ සංචාරක සංවර්ධන අරමුදලේ හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම් ශේෂ සමඟ සැසඳීමේදී පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් විස්තරය | සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් අනුව | සංචාරක සංවර්ධන අරමුදලේ ගිණුම් අනුව | සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම් අනුව | වෙනස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| (අ) ලැබිය යුතු අපගමන හා සංචාරක සංවර්ධන බදු ආදායම | 935,491,177 | 995,584,564 | - | 60,093,387 |
| (ආ) විවිධ ණයහිමියෝ | 18,750,304 | - | 24,448,523 | 5,698,219 |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂවලින් රු.3,328,920 ක් වර්ෂ 05 කට වැඩි කාලයක් ද, රු.355,000 ක් වර්ෂ 03 කට වැඩි වර්ෂ 05 කට අඩු කාලයක් ද රු.2,618,893 ක් වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක් ද සහ රු.1,043,291,927 ක් වර්ෂ 1 කට අඩු කාලයක් ද සහිත හිඟ ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ආ) චීන තානාපති කාර්යාලයෙන් අයවිය යුතු වර්ෂ 4 කට වැඩි ණයගැති ශේෂය රු.19,731,593 ක් වූ අතර අනෙකුත් තානාපති කාර්යාලවලින් වර්ෂ 01 කට වැඩි හා වර්ෂ 03 කට අඩු අයවිය යුතු ණයගැති ශේෂය රු.16,186,544 ක්ද වර්ෂ 01 කට අඩු අයවිය යුතු ණය ශේෂය රු.18,533,891 ක්ද විය.

(ඇ) ගෙවිය යුතු ශේෂවල ඇතුළත් රු.1,277,280 ක් වර්ෂ 05 කට වැඩි කාලයක්ද රු.6,607,680 ක් වර්ෂ 05කට අඩු වර්ෂ 04 කට වැඩි කාලයක්ද රු.2,839,476 ක් වර්ෂ 04 කට අඩු වර්ෂ 01 කට වැඩි කාලයක්ද රු.8,025,868 ක් වර්ෂ 01 කට අඩු කාලයක්ද සහිත ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ඇ) අන්තර් ජාතික ඉන්දියානු චිත්‍රපට සම්මාන උළෙල - 2010 (IIFA) වෙනුවෙන් 2010 වර්ෂයේදී හෝටලයක් වෙත ගෙවන ලද රු.1,575,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | සෑම ලිත් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාවක්, ලිත් වර්ෂයේ මාස හතක් අවසාන වීමට පෙරාතුව අර්ධ වාර්ෂික ගිණුම්, කාර්යාංශය ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ඉදිරි 03 අවුරුදු කාලසීමාවකට අපේක්ෂිත සැලැස්මක් හා පූර්ව වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද සැලසුම් සම්බන්ධයෙන් වූ කාර්ය සාධනය සහ ඉෂ්ඨ කර ගැනීම ඇතුලත් ප්‍රකාශයන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 වගන්තියේ 5 උපවගන්තිය සහ 11 වගන්තිය | භාණ්ඩාගාරයට අය කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ රු.233,164,067 ක අතිරික්තයක් ලැබී තිබුණු අතර මුදල් පනතේ විධිවිධානවල සඳහන් මුදල් යෙදවීමෙන් පසු වර්ෂයේ ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරි සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට කටයුතුකර නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.මිලියන 2,000 ක් කෙටිකාලීන ආයෝජන ලෙස රාජ්‍ය බැංකු වල ආයෝජනය කර තිබුණි. මේ සඳහා මුදල් අමාත්‍යවරයාගේ අවසරය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 | වටිනාකම රු.308,700 ක් වන ලැප්ටොප් පරිගණක 03 ක් නැති වීම සම්බන්ධ වූ අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 757 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර භාණ්ඩාගාර ලේකම්ගේ එකහත්වය ලබා ගත යුතු වුවද, කාර්යාංශය විසින් මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වටිනාකම රු.2,000,000 ඉක්මවන රාජ්‍ය ආයතන හා රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා කරන අනුග්‍රාහක වියදම් හෝ පරිත්‍යාග සඳහා හා ඉන් බාහිරව ගෙවනු ලබන රු.100,000 ඉක්මවන අනුග්‍රහක වියදම් හෝ පරිත්‍යාග සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2016 වර්ෂයේදී එවැනි අනුමැතියකින් තොරව අනුග්‍රහක වියදම් සහ පරිත්‍යාග සඳහා එකතුව රු.26,278,110ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,733,164,067 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,443,689,744 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.289,474,323 ක වැඩිවීමක් දැක්වුණි. අපගමන බදු රු.270,830,123 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.476,209,102 ක අතිරික්තය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂය අවසානයට රු. 233,164,067 ක් ලෙස පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2012 වර්ෂයේ දායකත්වය රු. 508,664,239 ක් වූ අතර 2016 වර්ෂයේ දී රු. 1,823,085,390 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 කාර්යාංශයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

බාහිර පාර්ශව විසින් කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබූ නඩු 07ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නොවිසඳී තිබුණි.

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයට අදාළව ජංගම අනුපාතය පිළිවෙලින් 10:1 හා 14:1 ක් වූයෙන් ඉහල ද්‍රවශීලතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර අඛණ්ඩව කෙටිකාලීන ආයෝජන වල මුදල් යොදවා තිබීම මෙයට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 40(4) වගන්තිය අනුව කාර්යාංශයේ පරමාර්ථ පහත පරිදි වේ.

- අධිකාරියේ උපදෙස් විමසා සංචාරක සංවර්ධන සැලැස්මට අනුකූලව විශිෂ්ඨ සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස සෘජුව හෝ වක්‍රව ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රයේ අළෙවිකරණය සහ ප්‍රවර්ධනය;

- දකුණු ආසියා කලාපයට දොරටුවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම; සහ

- කලාපයේ විශිෂ්ට සංචාරක කර්මාන්ත කළමනාකරණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රකට භාවයට පත් කිරීම.

**4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර නර්තන සැණකෙළිය සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදීම වෙනුවෙන් කාර්යාංශය විසින් පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ රු.1,500,000 ක අත්තිකාරම් ගෙවා තිබුණ ද අදාල සැණකෙළිය පවත්වා නොතිබුණු අතර ගෙවූ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී රු.70,321,758 ක වියදමක් දරා පෞද්ගලික ආයතනයක් වෙතින් Global Television Campaign නමින් රූපවාහිනි වැඩසටහන් දෙකක් 2014 වර්ෂයේ නිර්මාණය කර තිබුණද අල් ජසීරා රූපවාහිනී සේවය ඔස්සේ එකී වැඩසටහන් විගණිත දිනය වූ 2017 ජූනි 30 දක්වා ප්‍රචාරයවූ බවට සනාථ නොවීය.

(ඇ) 2013, 2014 හා 2015 වර්ෂවලදී කාර්යාංශය මඟින් අධිකාරිය වෙත ජලය, විදුලිය හා දුරකථන බිල්පත් වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද රු.824,363ක මුදල වෙන් වෙන්ව හඳුනාගෙන තිබුණද 2016 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂය සඳහා උපචිත වියදම් ලෙස විවිධ අංශවලින් ඉදිරිපත් කළ වටිනාකමින් රු.25,102,429 ක් ගිණුම් අංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව කළමනාකරණය විසින් උපචිත වියදම් හඳුනාගැනීමේදී නිසි පදනමකින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ විගණන විමසුම් 04 කට 2017 නොවැම්බර් 20 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අන්තර් ජාතික ඉන්දියානු චිත්‍රපට උළෙල 2010 වෙනුවෙන් වියදම් දැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යන ආයතන දෙකට එරෙහිව ගොනු කරන ලද අංක HC(civil)480/2011/DMR දරන නඩුවේ තීන්දුව අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල රු.23,803,179 ක් කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

(ආ) 2014 සහ 2015 වර්ෂවල ගිණුම් ඉදිරිපත් කිරීමේදී හඳුනා ගෙන නොතිබුණු 2014 වර්ෂයට අදාළ රු.135,784,470 ක් 2016 වර්ෂයේදී ගිණුම්වලට ඇතුළත් කර තිබුණි.

**4.4 දෘශ්‍ය අක්‍රමිකතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රුසියාවේ මොස්කව් නුවර පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන (Leisure Travel and Tourism fair – 2014) සඳහා ටීෂර්ට් මිල දී ගැනීම වෙනුවෙන් රු.7,800,000 ක් වැය කර තිබූ නමුත් එකී ටීෂර්ට් තොග ආයතනය වෙත ලැබී නොතිබූ අතර එකී මිලදී ගැනීම් වෙනුවෙන් පිළියෙල කළ ලේඛන පිළිගත නොහැකි විය.

(ආ) පිළිගත් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව 2010 වර්ෂයේදී ජාත්‍යන්තර ඉන්දියානු සිනමා උළෙල (IIFA) වෙනුවෙන් රු.1,116,000 ක් වැයකර මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක 07 ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 03 ක් ගබඩාවට භාරගත් බවට හෝ නිළධාරීන් අතර බෙදාහැරි බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකළ අතර ඒවා භෞතික පරීක්ෂාවටද ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 69 ට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කර නොතිබියදී හා එහි රීති 74 ට අනුව ගොනුවක් පවත්වා නොතිබියදී, අමාත්‍යාංශ අනුමැතියකින් හා කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව සුදුසුකම් නොමැති නිළධාරිනියක උත්සව අවස්ථා අධ්‍යක්ෂක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර 2014 දෙසැම්බර් සිට 2016 මැයි දක්වා ඇයට වැටුප්, දුරකථන බිල්, ඉන්ධන හා වාහන දීමනා හා සුව දැහැන රක්ෂණ ක්‍රමය වෙනුවෙන් රු.1,689,340ක් ගෙවා තිබුණි.

(ඈ) ප්‍රංශ සංචාරක නියෝජිත ජාතික සංගමයේ වාර්ෂික සම්මේලනය ශ්‍රී ලංකාවේ පැවැත්වීම වෙනුවෙන් සම්මේලන කාර්යාංශය සමඟ ඇති කර ගෙන තිබූ අවබෝධතා ගිවිසුමට අනුව ගුවන් ගමන් ගාස්තු යුරෝ 500 ක් දක්වා පැමිණෙන සංචාරකයන් විසින් දරාගත යුතුය. එහෙත් ශ්‍රී ලංකාව හා ප්‍රංශය අතර සෘජු ගුවන් ගමන් නතර කිරීම හේතුවෙන් මගියෙකුට දැරීමට සිදුවන වැඩිවන ගුවන් ගමන් ගාස්තුව පහසුකම් සපයන රටින් දැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව වැඩිවන ගුවන් ගමන් ගාස්තුව පමණක් කාර්යාංශය මඟින් දැරිය යුතු වුවද, ගෙවිය යුතු ගාස්තුව නිශ්චය කර ගැනීමකින් තොරව ගුවන් සේවා සමාගම විසින් ඉදිරිපත් කරන ලද බිල්පතෙහි සම්පූර්ණ වටිනාකම වූ රු.37,442,851 ක් වර්ගීකරණය කර ගැනීමකින් තොරව කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 20කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩුව පැවති අතර එයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව 09 ක් විය.

(ආ) සංචාරක කටයුතු පනතේ 40(7) වගන්තියට හා රාජ්‍ය සේවා කොමිෂන් සභා පරිපාටික රීති 69,70,72,73 හා 74 ට පටහැනිව කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂක තනතුරට සුදුසුකම් නොමැති නිලධාරියෙකු බඳවා ගෙන 2016 මාර්තු සිට මැයි දක්වා කාලය සඳහා වැටුප් ලෙස රු.1,556,110 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

පහත කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එම ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ද හඳුන්වා දී නොතිබුණි. කෙසේ වුවද,ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේ දී වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 534 න් 225 ක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විදේශ අලෙවි ප්‍රවර්ධනය වෙනුවෙන් ප්‍රධාන රටවල් 21 ක් තුළ ඉසව් 122 ක් සැලසුම් කර තිබුණද එයින් ඉසව් 80 ක් පමණක් පවත්වා තිබුණි. ඒ වෙනුවෙන් විදේශ මුදල් ඒකක වලින් විදේශ සැපයුම්කරුවන්ට ගෙවා තිබූ රු. මිලියන 438.36 ක මුදලින්, රු. මිලියන 78.92 ක් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ගෙවීම් සිදු නොකර සෘජුවම කාර්යාංශය විසින් සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ පරිච්ඡේදයේ 4.2.1 (අ), (ආ) සහ (ඇ) වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමග අවම වශයෙන් වසර තුනක් ආවරණය වනසේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

සමාලෝචිත වර්ෂයේ විෂයයන් 43 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 45 ක සිට සියයට 659 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2017 ජුලි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 03 දින සිට 06 දක්වා එක්සත් රාජධානියේ පැවැත් වූ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව මිලදී ගන්නා ලද රු.350,000 ක් වටිනා මැණික් ගල් 02 ක් හා නොමිලේ කාර්යාංශය වෙත ලැබුණු මැණික් ගල් 02 ක් ගබඩා තොග පොත්වල ඇතුලත් කර නොතිබුණු අතර නොමිලයේ ලැබුණ මැණික් ගල් 02 හි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමද සිදු කර නොතිබුණි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා අනුව කැරට් 1.4,1.6,1.63 හා 1.54 බර මැණික් 4 ක් කාර්යාංශයට ලැබී තිබුණු බැවින් රු.350,000 කට මිලදීගත් මැණික් ගල් 02 ක බර කැරට් 5.6 ක් වූයෙන් ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා හා ඉන්වොයිසියේ සඳහන් විස්තර අනුව මැණික් ගල් වල කැරට් බර නොසැසඳුණි.

(ආ) 2014 වර්ෂයේ ලෝක සංචාරක දිනය නිමිත්තෙන් යයි දක්වමින් රු.5,824,000 ක මුදලක් වැයකර මුද්‍රණය කර තිබූ ටීෂර්ට්, එකී සැපයුම් ආයතනයේ අධ්‍යක්ෂකගේ ප්‍රකාශය පරිදි මුද්‍රණයකර තිබුණේ දේශපාලන පක්ෂයක ප්‍රචාරක කටයුත්තක් ලෙසිනි.

(ඈ) සංචාරක ක්ෂේත්‍රය තුළ සමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික ආයතන දෙකකට රු.99,439,900 (බදු රහිත) ක මුදලක් ගෙවා තිබූ නමුත් එකී ගෙවීම් පිළිගත නොහැකි ගෙවීම් බවට නිරීක්ෂණය විය.

(ඇ) එක්සත් රාජධානියේ පැවැත්වූ වෙළෙඳ ප්‍රදර්ශනයේ " (WTM) (UK) 2014" වෙළඳ ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ලබා දීමේදී මිල කැඳවුම් ලිපි විවෘත කලයුතු දිනට දින 04 කට කලින් විවෘත කිරීම, ටෙන්ඩර්කරු හෝ නියෝජිතයෙක් ටෙන්ඩර් ලිපි විවෘත කරන අවස්ථාවට සහභාගී නොවීම, කොන්ත්‍රාත්කරු බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹ එහි පිටපතක් ප්‍රවර්ධන කාර්යාංශය වෙත එවිය යුතු බවට උපදෙස් දී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර සහ වෙළඳ ප්‍රදර්ශන කුටි සාර්ථකව ඉදිකළ බවට වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව එම ඉදිකිරීම සඳහා කාර්යාංශය විසින් රු.17,803,508 ක ගෙවීමක් කාර්යාංශය සිදු කර තිබුණි.

(ඉ) චීන මාධ්‍යවේදීන් 12 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණීය ප්‍රදේශ කිහිපයක් ආවරණය වන පරිදි සිදු කළ FAM චාරිකාව සඳහා රු.3,506,757 ක් වැයකර තිබුණු අතර එම චාරිකාව පිළිබඳ වාර්තා චීන මාධ්‍ය මඟින් ප්‍රචාරය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2014 (ICC) ලෝක කුසලාන විස්සයි විස්ස ක්‍රිකට් තරඟාවලියේ ක්‍රිකට් පෝස්ටර් මුද්‍රණ සම්බන්ධ ප්‍රසම්පාදනයේ, ප්‍රසම්පාදන කමිටු තීරණය 2014 අප්‍රේල් 28 දින ලබා දී තිබුණද, ටෙන්ඩර් විවෘත කළ 2014 අප්‍රේල් 08 දිනදීම තාක්ෂණික ඇගයීම් කමිටුව රැස් වී තම වාර්තාව ලබා දීම, පෞද්ගලික ආයතනයකින් බදු සමඟ රු. 700,000 ක ඉන්වොයිසිය ලැබීම සහ ක්‍රිකට් පෝස්ටර් සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත ලැබීමට අදාල භාණ්ඩ භාර ගැනීමේ පත්‍රිකාව නිකුත් කිරීම නිසා මෙම කාර්යය විනිවිදභාවයකින් යුතුව සිදු වී තිබේද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම්කරණය නොකිරීම, ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල අගය නිවැරදි ලෙස ගිණුම්ගත නොකිරීම සහ ලැබිය යුතු ගිණුම් නිවැරදිව ගිණුම්වලින් හෙළිදරව් නොකිරීම, පූර්ව වර්ෂ ගැලපීම් නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| (ආ) අයවැය ලේඛනමය පාලනය | අයවැය සහ තථ්‍ය වියදම්වල සැලකිය යුතු විචලනයන් පැවතීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩලය පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) ප්‍රසම්පාදනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඉ) ස්ථාවර වත්කම් ලේඛනමය පාලනය | කාර්යාංශය ස්ථාවර වත්කම් සියල්ල හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් නොකිරීම. |